# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2431/44 – 2025 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා – 2025.04.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල් .ඩී. බී. 14/2008(V).

**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6(ඉ) වන සහ 21 වන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 51 වන වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය දම්මික පටබැඳි,
පරිසර අමාත්‍ය.

2025 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2016 දෙසැම්බර් මස 6 වන දින අංක 1996/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 සමුද්‍රීය පරිසර ආරක්ෂණ (අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-


1A – PG7078 – 06 (2025/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(1) එහි 3 වන නියෝගයේ "යම් සේවා සපයන්නකු විසින්" යන වචන වෙනුවට "අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම සඳහා අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇති යම් සේවා සපයන්නකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි 4 වන නියෝගයේ (2) වන ඡේදයේ (අ) අනුඡේදයේ "යම් සේවා සපයන්නකුට විධාන කිරීම" යන වචන වෙනුවට "අධිකාරියේ ලියාපදිංචි යම් සේවා සපයන්නකුට විධාන කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;

(3) 5 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්:-

"5අ. අධිකාරිය හෝ ලියාපදිංචි සේවා සපයන්නකු හැර, වරායක්, නැව් තොටක්, පර්යන්තයක්, නැව් අලුත්වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් භාර වෙනත් යම් තැනැත්තකු, නැව් අයිතිකරුවකු, නැවක අනුයෝජිතයකු හෝ නෞකාධිපතිවරයකු විසින්, ඉවත් කරනු ලබන නැව් අපද්‍රව්‍ය භාවිත කිරීම හෝ ඉවත් කරනු ලබන නැව් අපද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත්වීම කරනු නොලැබිය යුතු ය.";

(4) එහි 6 වන නියෝගයේ:-

(අ) (1) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකමක් සැපයීම සඳහා අධිකාරියේ සේවා සපයන්නකු ලෙස ලියාපදිංචිවීමට අපේක්ෂා කරන යම් සමාගමක් සතුව, එකී සේවා සපයන්නා විසින් අපද්‍රව්‍ය තෙල් ඉවත් කිරීම සඳහා ඒ, බී, සී සහ ඩී ලෙස ලියාපදිංචිවීමට අපේක්ෂා කරන සේවා කාණ්ඩ අනුව පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතු ය:-

**අපද්‍රව්‍ය තෙල්**

**"අ" කාණ්ඩය - ඝන මීටර 200 කට වැඩි අපද්‍රව්‍ය තෙල් සේවා සපයන්නන්**

මේ කාණ්ඩයේ සේවා සපයන්නන් විසින් එක් නැවකින් ඝන මීටර 200කට වැඩි අපද්‍රව්‍ය තෙල් ඉවත් කරනු ලබන අතර, ඉල්ලුම්කරුවන් විසින්, මේ කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබීම සඳහා පහත දැක්වෙන නියමයන් සපුරාලනු ලැබිය යුතු ය:-

(අ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ යථා පරිදි ලියාපදිංචි කළ සමාගමක් විය යුතු ය;

(ආ) ඉල්ලුම්කරුට, නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය තෙල් බැහැර කිරීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් සාදන ලද නියෝගවලට අනුකූලව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද තමාගේම වූ අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකමක් තිබිය යුතු ය;

(ඇ) දිනකට ඝන මීටර 100 ක අවම පිරිසැකසුම් ධාරිතාවක් ද සහිතව, තෙල් බොර, අපද්‍රව්‍ය තෙල්, අපවිත්‍ර ජලය හෝ දූෂිත/ ප්‍රතික්ෂේපිත/ භාවිත කළ නොහැකි පෙට්‍රෝලියම් නිෂ්පාදන වැනි නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ, ප්‍රතිචක්‍රීකරණය කිරීමේ හෝ බැහැර කිරීමේ හැකියාව පහසුකමට තිබිය යුතු ය;

(ඈ) ඉල්ලුම්කරුගේ පරිශ්‍රයේ ඝන මීටර 1000 ක අවම ගබඩා ධාරිතාවක් තිබිය යුතු ය;

(ඉ) ඉල්ලුම්කරුට, ඝන මීටර 400කට නොඅඩු ධාරිතාවක් ඇති නැව් හෝ ඝන මීටර 400කට නොඅඩු ධාරිතාවක් ඇති බත්තල් එකකට වැඩි සංඛ්‍යාවක් ද ඇතුළුව, තමාගේම, මුහුදේ දී අපද්‍රව්‍ය එකතු කිරීමේ අවම ධාරිතාවක් තිබිය යුතු ය. ඉල්ලුම්කරුගේ අපද්‍රව්‍ය එකතු කිරීමේ වාහන සමූහයේ මුළු ධාරිතාව ඝන මීටර 1000කට වැඩි විය යුතු අතර එය අපද්‍රව්‍ය තෙල් ප්‍රවාහනය කිරීම සඳහා වෙළඳ නැව් අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් අනුමත කර තිබිය යුතු ය;

(ඊ) ඉල්ලුම්කරුට, ආරක්ෂිතබව පරීක්ෂා කළ බවට වන වලංගු සහතිකවලින් සමන්විත සහ නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය වරායේ සිට ඉල්ලුම්කරුගේ පිරිසැකසුම් පිරියත දක්වා මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධිකාරිය

විසින් අනුමත කරන ලද ජී.පී.එස්. පද්ධති සවිකරන ලද, ඝන මීටර 200 ක අවම ධාරිතාවකින් යුත් ප්‍රවාහන රථ සමූහයක් ද ඇතුළුව නිසි මාර්ග ප්‍රවාහන පහසුකම් තිබිය යුතු ය;

(උ) ඉල්ලුම්කරු විසින්, ඉල්ලුම්පත්‍රය සමඟ ශ්‍රී ලංකා රේගුවෙන් නිකුත් කළ නිෂ්කාශන ලිපියක්/ විරෝධතා නොදැක්වීමේ ලිපියක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ඌ) ශ්‍රී ලංකාව තුළ පෙට්‍රෝලියම් නිෂ්පාදන විකිණීම සඳහා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබාදුන් වලංගු අනුමතයක් ඉල්ලුම්කරු සතුව තිබිය යුතු ය;

(එ) ඉල්ලුම්කරුට ප්‍රවාහන රථ, නළ, ගබඩා කිරීමේ, ජලාපහරණය කිරීමේ හෝ පිරිපහදු කිරීමේ පහසුකම් මගින් සිදුවන යම් දූෂණ සිදුවීම් ආවරණය කිරීම සඳහා රු. මිලියන 5 ක බැංකු ඇපකරයක් හෝ තැන්පතුවක් ලබාදීමේ හැකියාව තිබිය යුතු ය;

**"ආ" කාණ්ඩය - අපද්‍රව්‍ය තෙල් සේවා සපයන්නන් (ඝන මීටර 200 - ඝන මීටර 75)**

මේ කාණ්ඩයේ සේවා සපයන්නන් විසින් එක් නැවකින් ඝන මීටර 200කට නොවැඩි එහෙත් ඝන මීටර 75කට නොඅඩු අපද්‍රව්‍ය තෙල් ඉවත් කරනු ලබන අතර, ඉල්ලුම්කරුවන් විසින්, මේ කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබීම සඳහා පහත දැක්වෙන නියමයන් සපුරාලනු ලැබිය යුතු ය:-

(අ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ යථා පරිදි ලියාපදිංචි කළ සමාගමක් විය යුතු ය;

(ආ) ඉල්ලුම්කරුට, නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය තෙල් බැහැර කිරීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් සාදන ලද නියෝගවලට අනුකූලව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද තමාගේම අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකමක්; හෝ

ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා, පිරිසැකසුම් කිරීම පිණිස අපද්‍රව්‍ය තෙල් එකතුව ප්‍රතිග්‍රහණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද අපද්‍රව්‍ය තෙල් පිරිසැකසුම් පිරියතක් සමඟ ඇතිකරගත් ගිවිසුමක්, තිබිය යුතු ය;

(ඇ) ඉල්ලුම්කරුගේ පරිශ්‍රයේ ඝන මීටර 500 ක අවම ගබඩා ධාරිතාවක් තිබිය යුතු ය;

(ඈ) ඉල්ලුම්කරුට -

ටොන් 400 කට වැඩි මුළු ධාරිතාවක් සහිත සහ අපද්‍රව්‍ය තෙල් ප්‍රවාහනය කිරීම සඳහා වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති, තම අපද්‍රව්‍ය එකතු කිරීමේ වාහන සමූහය තුළ එක් නැවක් හෝ බත්තලක් ද ඇතුළුව, තමාගේම මුහුදේ දී අපද්‍රව්‍ය එකතු කිරීමේ අවම ධාරිතාවක්; හෝ

ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා, අපද්‍රව්‍ය තෙල් එකතු කිරීමේ සේවාවන් ලබාගැනීම සඳහා ඝන මීටර 400කට වැඩි ධාරිතාවක් ඇති අපද්‍රව්‍ය තෙල් එකතු කිරීමේ නැව් මෙහෙයවන සමාගමක් සමඟ ඇතිකර ගත් ගිවිසුමක්, තිබිය යුතු ය;

(ඉ) ඉල්ලුම්කරුට, ආරක්ෂිතබව පරීක්ෂා කළ බවට වන වලංගු සහතිකවලින් සමන්විත සහ නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය වරායේ සිට ඉල්ලුම්කරුගේ පිරිසැකසුම් පිරියත දක්වා මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධිකාරිය විසින් අනුමත කරන ලද ජී.පී.එස්. පද්ධති සවිකරන ලද, ඝන මීටර 60ක අවම ධාරිතාවකින් යුත් ප්‍රවාහන රථ සමූහයක් ද ඇතුළුව නිසි මාර්ග ප්‍රවාහන පහසුකම් තිබිය යුතු ය;

(ඊ) ඉල්ලුම්කරු විසින්, ඉල්ලුම්පත්‍රය සමඟ ශ්‍රී ලංකා රේගුවෙන් නිකුත් කළ නිෂ්කාශන ලිපියක්/ විරෝධතා නොදැක්වීමේ ලිපියක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(උ) ශ්‍රී ලංකාව තුළ පෙට්‍රෝලියම් නිෂ්පාදන විකිණීම සඳහා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබාදුන් වලංගු අනුමතයක් ඉල්ලුම්කරු සතුව තිබිය යුතු ය;

(ඌ) ඉල්ලුම්කරුට ප්‍රවාහන රථ, නළ, ගබඩා කිරීමේ, ජලාපහරණය කිරීමේ හෝ පිරිපහදු කිරීමේ පහසුකම් මගින් සිදුවන යම් දූෂණ සිදුවීම් ආවරණය කිරීම සඳහා රු. මිලියන 5ක බැංකු ඇපකරයක් හෝ තැන්පතුවක් ලබාදීමේ හැකියාව තිබිය යුතු ය;

**"ඇ" කාණ්ඩය - අපද්‍රව්‍ය තෙල් සේවා සපයන්නන් ( ඝන මීටර 75 - ඝන මීටර 50)**

මේ කාණ්ඩයේ සේවා සපයන්නන් විසින් එක් නැවකින් ඝන මීටර 75කට නොවැඩි එහෙත් ඝන මීටර 50කට නොඅඩු අපද්‍රව්‍ය තෙල් ඉවත් කරනු ලබන අතර, ඉල්ලුම්කරුවන් විසින්, මේ කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබීම සඳහා පහත දැක්වෙන නියමයන් සපුරාලනු ලැබිය යුතු ය:-

(අ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ යථා පරිදි ලියාපදිංචි කළ සමාගමක් විය යුතු ය;

(ආ) ඉල්ලුම්කරුට, නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය තෙල් බැහැර කිරීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් සාදන ලද නියෝගවලට අනුකූලව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද තමාගේම අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකමක් හෝ ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා, පිරිසැකසුම් කිරීම පිණිස අපද්‍රව්‍ය තෙල් එකතුව ප්‍රතිග්‍රහණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද අපද්‍රව්‍ය තෙල් පිරිසැකසුම් පිරියතක් සමඟ ඇතිකරගත් ගිවිසුමක් තිබිය යුතු ය;

(ඇ) ඉල්ලුම්කරුගේ පරිශ්‍රයේ ඝන මීටර 150ක අවම ගබඩා ධාරිතාවක් තිබිය යුතු ය;

(ඈ) ඉල්ලුම්කරුට -

ටොන් 400කට වැඩි මුළු ධාරිතාවක් සහිත සහ අපද්‍රව්‍ය තෙල් ප්‍රවාහනය කිරීම සඳහා වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති, තම අපද්‍රව්‍ය එකතු කිරීමේ වාහන සමූහය තුළ එක් නැවක් හෝ බත්තලක් ද ඇතුළුව, තමාගේම, මුහුදේ දී අපද්‍රව්‍ය එකතු කිරීමේ අවම ධාරිතාවක්; හෝ

ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා අපද්‍රව්‍ය තෙල් එකතු කිරීමේ සේවාවන් ලබාගැනීම සඳහා ඝන මීටර 400කට වැඩි ධාරිතාවක් ඇති අපද්‍රව්‍ය තෙල් එකතු කිරීමේ නැව් මෙහෙයවන සමාගමක් සමඟ ඇතිකරගත් ගිවිසුමක්,

තිබිය යුතු ය;

(ඉ) ඉල්ලුම්කරුට, ආරක්ෂිතබව පරීක්ෂා කළ බවට වන වලංගු සහතිකවලින් සමන්විත සහ නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය වරායේ සිට ඉල්ලුම්කරුගේ පිරිසැකසුම් පිරියත දක්වා මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධිකාරිය විසින් අනුමත කරන ලද ජී.පී.එස්. පද්ධති සවිකරන ලද, ඝන මීටර 40ක අවම ධාරිතාවකින් යුත් ප්‍රවාහන රථ සමූහයක් ද ඇතුළුව නිසි මාර්ග ප්‍රවාහන පහසුකම් තිබිය යුතු ය;

(ඊ) ඉල්ලුම්කරු විසින්, ඉල්ලුම්පත්‍රය සමඟ ශ්‍රී ලංකා රේගුවෙන් නිකුත් කළ නිෂ්කාශන ලිපියක්/ විරෝධතා නොදැක්වීමේ ලිපියක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(උ) ශ්‍රී ලංකාව තුළ පෙට්‍රෝලියම් නිෂ්පාදන විකිණීම සඳහා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබාගත් වලංගු අනුමතයක් ඉල්ලුම්කරු සතුව තිබිය යුතු ය;

(ඌ) ඉල්ලුම්කරුට ප්‍රවාහන රථ, නළ, ගබඩා කිරීමේ, ජලාපහරණය කිරීමේ හෝ පිරිපහදු කිරීමේ පහසුකම් මගින් සිදුවන යම් දූෂණ සිදුවීම් ආවරණය කිරීම සඳහා රු. මිලියන 5ක බැංකු ඇපකරයක් හෝ තැන්පතුවක් ලබාදීමේ හැකියාව තිබිය යුතු ය.

**"ඇ" කාණ්ඩය - අපද්‍රව්‍ය තෙල් සේවා සපයන්නන් (ඝන මීටර 50 කට අඩු)**

මේ කාණ්ඩයේ සේවා සපයන්නන් විසින් එක් නැවකින් ඝන මීටර 50 කට නොවැඩි අපද්‍රව්‍ය තෙල් ඉවත් කරනු ලබන අතර, ඉල්ලුම්කරුවන් විසින් මේ කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබීම සඳහා පහත දැක්වෙන නියමයන් සපුරාලනු ලැබිය යුතු ය:-

(අ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ යථා පරිදි ලියාපදිංචි කළ සමාගමක් විය යුතු ය;

(ආ) ඉල්ලුම්කරුට -

නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය තෙල් බැහැර කිරීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් සාදන ලද නියෝගවලට අනුකූලව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද තමාගේම අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකමක්; හෝ

ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා, පිරිසැකසුම් කිරීම පිණිස ඉල්ලුම්කරුගේ අපද්‍රව්‍ය තෙල් එකතුව ප්‍රතිග්‍රහණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද අපද්‍රව්‍ය තෙල් පිරිසැකසුම් පිරියතක් සමඟ ඇතිකරගත් ගිවිසුමක්,

තිබිය යුතු ය;

(ඇ) ඉල්ලුම්කරුගේ පරිශ්‍රයේ ඝන මීටර 100 ක අවම ගබඩා ධාරිතාවක් තිබිය යුතු ය;

(ඈ) ඉල්ලුම්කරුට -

ටොන් 400 කට වැඩි මුළු ධාරිතාවක් සහිත සහ අපද්‍රව්‍ය තෙල් ප්‍රවාහනය කිරීම සඳහා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති, තම අපද්‍රව්‍ය එකතුකිරීමේ වාහන සමූහය තුළ එක් නැවක් හෝ බත්තලක් ද ඇතුළුව, තමාගේම, මුහුදේ දී අපද්‍රව්‍ය එකතු කිරීමේ අවම ධාරිතාවක්; හෝ

ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා අපද්‍රව්‍ය තෙල් එකතු කිරීමේ සේවාවන් ලබාගැනීම සඳහා ඝන මීටර 400 කට වැඩි ධාරිතාවක් ඇති අපද්‍රව්‍ය තෙල් එකතු කිරීමේ නැව් මෙහෙයවන සමාගමක් සමඟ ඇතිකරගත් ගිවිසුමක්,

තිබිය යුතු ය;

(ඉ) ඉල්ලුම්කරුට, ආරක්ෂිතබව පරීක්ෂා කළ බවට වන වලංගු සහතිකවලින් සමන්විත සහ නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය වරායේ සිට ඉල්ලුම්කරුගේ පිරිසැකසුම් පිරියත දක්වා මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධිකාරිය විසින් අනුමත කරන ලද ජී.පී.එස් පද්ධති සවිකරන ලද, ඝන මීටර 20 ක අවම ධාරිතාවකින් යුත් ප්‍රවාහන රථ සමූහයක් ද ඇතුළුව නිසි මාර්ග ප්‍රවාහන පහසුකම් තිබිය යුතු ය;

(ඊ) ඉල්ලුම්කරු විසින්, ඉල්ලුම්පත්‍රය සමඟ ශ්‍රී ලංකා රේගුවෙන් නිකුත් කළ නිෂ්කාශන ලිපියක්/ විරෝධතා නොදැක්වීමේ ලිපියක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(උ) ශ්‍රී ලංකාව තුළ පෙට්‍රෝලියම් නිෂ්පාදන විකිණීම සඳහා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබාගත් වලංගු අනුමතයක් ඉල්ලුම්කරු සතුව තිබිය යුතු ය;

(ඌ) ඉල්ලුම්කරුට ප්‍රවාහන රථ, නළ, ගබඩා කිරීමේ, ජලාපහරණය කිරීමේ හෝ පිරිපහදු කිරීමේ පහසුකම් මගින් සිදුවන යම් දූෂණ සිදුවීම් ආවරණය කිරීම සඳහා රු. මිලියන 5 ක බැංකු ඇපකරයක් හෝ තැන්පතුවක් ලබාදීමේ හැකියාව තිබිය යුතු ය.

මළ අපද්‍රව්‍ය

(අ) උපකරණ ද සමග, අනුමත මළ අපද්‍රව්‍ය ප්‍රවාහන පහසුකමක්;

(ආ) අනුමත මළ අපද්‍රව්‍ය පිළියම් කිරීමේ පිරියතක් හෝ අනුමත මළ අපද්‍රව්‍ය පිළියම් කිරීමේ හෝ බැහැර කිරීමේ පහසුකමක් සමඟ ඇතිකරගත් ගිවිසුමක්;

කසළ

(අ) අනුමත ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ සහ වෙන් කිරීමේ පහසුකමක්;

(ආ) විවිධ වර්ගවල කසළ සඳහා වන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පහසුකම් සමඟ ඇතිකරගත් ගිවිසුමක්.

(1අ) සේවා සපයන්නකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමඟ මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.”.

(ආ) එහි (2) වන ඡේදයේ :-

(i) “(1) වන ඡේදය” යන වචන සහ ඉලක්කම වෙනුවට “(1අ) වන ඡේදය” යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(ii) එහි (ඈ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(ඈඈ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ පිටපතක්;”;

(iii) එහි (ඔ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන්:-

“( ඕ) තෙල් ගබඩා ටැංකි සංකීර්ණයේ සහ ජලාපහරණ හෝ පිරිපහදු පහසුකමේ සවිස්තරාත්මක සැලැස්මේ සහ ගිනි නිවීම් සහ තෙල් පිටාරගැලීම් හදිසි සැලැස්මේ පිටපතක්;

(ක) සේවා සපයන්නා විසින් නැව්වලින් අපද්‍රව්‍ය තෙල් එකතු කිරීම සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරන යාත්‍රාවේ හෝ බත්තලේ අදාළ සහතිකවල පිටපත්:-

(i) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නැව් ලියාපදිංචි වෙළඳ සහතිකය සහ ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිපාලනය වෙනුවෙන් වර්ගීකරණ සංගමය විසින් නිකුත් කරන ලද වත්මන් මැනුම් සහතිකය හෝ සමුද්‍ර යෝග්‍යතා සහතිකය;

(ii) ආරක්ෂණ සහ හානිපූරණ සමාජය විසින් නිකුත් කරන ලද දූෂණය පිළිබඳ වගකීම සඳහා වන රක්ෂණ සහතිකය (ආනුෂංගික අලාභ හානි යථාවත් කිරීමේ පිරිවැය ද ඇතුළුව);

(iii) “නැවෙහි ඇති තෙල්වලින් සිදුවන දූෂණය පිළිබඳ හදිසි සැලැස්මේ” හෝ මාපෝල් 73/78 සම්මුතියේ I වන ඇමුණුමේ 37 වන නියෝගයට අනුකූලව යම් තෙල් පිටාරගැලීම් සිදුවීමක් පාලනය කිරීම සඳහා අධිකාරිය විසින් අනුමත කරන ලද විකල්ප සැලසුමක පිටපතක්;

(iv) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිපාලනය වෙනුවෙන් වර්ගීකරණ සංගමය විසින් නිකුත් කරන ලද, තෙල් මගින් සිදුවන මුහුදු දූෂණය වැළැක්වීම සඳහා වන උපකරණවල සහ මෙවලම්වල ක්‍රියාකාරීභාවය සහතික කරන ලද, ජාත්‍යන්තර තෙල් මගින් සිදුවන දූෂණය වැළැක්වීම පිළිබඳ වලංගු සහතිකයේ පිටපතක්;

(v) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිපාලනය වෙනුවෙන් වර්ගීකරණ සංගමය විසින් නිකුත් කරන ලද, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් කලින් කල සංශෝධිත 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (SOLAS 1974) අනුකූලව යාත්‍රාවේ සමුද්‍ර යෝග්‍යතාව; සහ

(vi) අධිකාරිය විසින් අනුමත කරන ලද සමාගමක් විසින් නිකුත් කරන ලද යාත්‍රාවේ නළ පරීක්ෂණ සහතිකවල පිටපතක්.

(ඇ) එහි (2) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) ශ්‍රී ලංකාවේ ජලතීරය හරහා ගමන් කරන නැව් සඳහා හෝ ශ්‍රී ලංකාවේ වරායවලට නොපැමිණෙන නැව් සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකමක් සැපයීම සඳහා සේවා සපයන්නකු ලෙස ලියාපදිංචිවීමට අපේක්ෂා කරන යම් සේවා සපයන්නකු විසින් පහත දැක්වෙන අතිරේක කොන්දේසි ද සපුරාලනු ලැබිය යුතු ය:-

(අ) රු. 5,000,000.00 ක බැංකු ඇපකරයක්;

(ආ) (i) ද්‍රව අපද්‍රව්‍ය සඳහා ඝන මීටර් 350 ක; හෝ
(ii) ඝන අපද්‍රව්‍ය සඳහා ඝන මීටර් 50 ක,
අවම ආරක්ෂිත අපද්‍රව්‍ය රැගෙනයාමේ ධාරිතාවක් ඇති යාත්‍රාවක් හෝ බත්තලක්;

(ඇ) අවශ්‍ය විටදී අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මෙහෙයුම් පිළිබඳ අක්වෙරළ අධීක්ෂණය සඳහා අධිකාරියේ නිලධරයන්ට පහසුකම් සපයනු ලැබිය යුතු ය; සහ

(ඈ) "අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා සම්බන්ධයෙන් වන ගෙවීම අයකර ගැනීමට අධිකාරියට හැකිකරවීම සඳහා, සේවා සපයන්නා විසින්, ලියාපදිංචි කිරීමේ වලංගු කාලසීමාව අවසන් වන තෙක් රු. 1,500,000.00 ක අවම තැන්පතුවක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය."

(5) මේ නියෝගවල 9 වන නියෝගය, ඒ නියෝගයේ (1) වන ඡේදයේ "සේවා සපයන්නකු විසින් තත්කාර්ය සඳහා යොදාගෙන ඇති උපකරණ ඇතුළත්ව" යන වචන වෙනුවට "නැවෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මෙහෙයුම, අපද්‍රව්‍ය ප්‍රවාහනය, අපද්‍රව්‍ය ගබඩා කිරීම සහ අපද්‍රව්‍ය පිළියම් කිරීම සහ බැහැර කිරීම සහ සේවා සපයන්නකු විසින් තත්කාර්ය සඳහා යොදාගෙන ඇති පහසුකම් සහ උපකරණ ද ඇතුළුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ;

(6) මේ නියෝගවල 10 වන නියෝගය, එහි (2) වන ඡේදයේ "සියලු අපද්‍රව්‍ය පිටකර ඇතිබවට" යන වචන වෙනුවට "සියලු අපද්‍රව්‍ය භාරදී ඇතිබවට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ;

(7) මේ නියෝගවල 10 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝගය එකතු කිරීමෙන්:-

"10අ. (1) 10 වන නියෝගයේ (2) වන ඡේදයේ කුමක් සඳහන් වුවද, එය විසින් 10 වන නියෝගයේ (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටිය අනුගමනය කරන්නේ නම් සහ එහි රැස්වී ඇති සහ භාරදීමේ වරාය තෙක් නැවේ අපේක්ෂිත මුහුදු ගමන අතරතුර එහි රැස්විය හැකි නැවෙහි උත්පාදනය වන සියලු අපද්‍රව්‍ය සඳහා ප්‍රමාණවත් වෙන්කළ ගබඩා ධාරිතාවක් ඇති බවට අධිකාරිය සෑහීමට පත්වන්නේ නම්, නැවක් විසින්, නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය භාරදීමෙන් තොරව ඊළඟ නැවතුම් වරාය වෙත ගමන් කිරීම ආරම්භ කරනු ලැබිය හැකි ය.

(2) නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය භාවිත කර භාරදෙන ලද, යම් වරායකට හෝ පර්යන්තයකට පැමිණි සියලු නැව් විසින්, එකී වරායෙන් හෝ පර්යන්තයෙන් පිටත්වීමට පෙරාතුව, අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්වලට භාරදෙන ලද අපද්‍රව්‍ය

වර්ගය සහ ප්‍රමාණය මත පදනම්ව එකී පිරිවැයට සැලකිය යුතු ලෙස දායකවීම සඳහා, නැවට සේවාව සපයන ලද ලියාපදිංචි සේවා සපයන්නාට ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.";

(8) එහි 12 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්:-

"12අ. වරායකට හෝ පර්යන්තයකට පැමිණෙන නැවක නෞකාධිපතිවරයා විසින්, නැව්බඩු අවශේෂ මාපෝල් 73/78 විධිවිධානවලට අනුකූලව යම් ලියාපදිංචි සේවා සපයන්නකු මාර්ගයෙන් අධිකාරිය විසින් සපයනු ලබන පහසුකමක් වෙත භාරදෙන බවට වගබලාගනු ලැබිය යුතු ය. නැව්බඩු අවශේෂ භාරදීම සඳහා වන යම් ගාස්තුවක් භාවිත කරන්නා විසින් සේවා සපයන්නාට ගෙවනු ලැබිය යුතු ය.";

(9) එහි 13 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"13. (1) එකී සේවා සපයන්නා විසින් ප්‍රතිග්‍රහණය කරනු ලබන අපද්‍රව්‍ය, අධිකාරිය විසින් නියම කරනු ලබන පරිදි බැහැර කිරීමට සෑම සේවා සපයන්නකුම වගබලා ගනු ලැබිය යුතු ය.

(2) නැවෙන් එකතු කරනු ලබන සියලූ අපද්‍රව්‍ය තෙල්, අනුමත පවිත්‍රකරණ පහසුකම වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) භාවිත කළ නොහැකි සියලූ අපද්‍රව්‍ය තෙල් අවශේෂ (මාපෝල් ඇමුණුම I) අවසාන වශයෙන් බැහැර කිරීම සඳහා අනුමත පහසුකමක් වෙත ප්‍රවාහනය කරනු ලැබිය යුතු ය.

(4) මාපෝල් ඇමුණුම IV (මළ අපද්‍රව්‍ය) සියලූ කලු සහ අළු ජලය, පිළියම් කිරීම සඳහා අනුමත පහසුකම් වෙත යොමු කරනු ලැබිය යුතු අතර, පිළියම් කිරීමෙන් පසුව එම ද්‍රව්‍ය මුහුදට හෝ උචිත ස්ථානවලට මුදාහරිනු ලැබිය හැකි ය.

(5) මාපෝල් ඇමුණුම V අපද්‍රව්‍ය (කසළ) සහ එකතු කරන ලද සියලූ කසළ වෙන්කර, සේවා සපයන්නා විසින් හිමිකාරිත්වය දරන අනුමත ගබඩා වෙත ප්‍රවාහනය කිරීම සහ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන වෙත යැවීම කරනු ලැබිය යුතු ය. සියලූ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය අධිකාරිය විසින් සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත පහසුකමක දී බැහැර කරනු ලැබිය යුතු ය.";

(10) එහි 15 වන නියෝගයේ, "අධිකාරිය" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"නැව්බඩු අවශේෂ" යන්නෙන්, ගොඩබෑමේ කාර්යපටිපාටි සහ පිරිසිදු කිරීමේ මෙහෙයුම් අවසන් කිරීමෙන් පසු ඉතිරිව පවතින, නැව්බඩු ගබඩාවල හෝ ටැංකිවල යම් නෞකාස්ථ නැව්බඩු ද්‍රව්‍යයක අවශේෂ අදහස් වන අතර, ඊට පැටවීමේ/ ගොඩබෑමේ අතිරික්තයන් සහ පිටාර ගැලීම් ද ඇතුළත් වේ.";

(11) I වන, II වන, III වන, IV වන, V වන, VI වන සහ VII වන උපලේඛන මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කරනු ලැබේ:-

{4(3) වන නියෝගය}

**I වන උපලේඛනය.** අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් ප්‍රමාණවත් නොවීම පිළිබඳ වාර්තා කිරීම සඳහා වන ආකෘතිපත්‍රය

**වරායේ ප්‍රතිග්‍රහණ පහසුකම්වලට අපද්‍රව්‍ය භාරදීම - පූර්ව දැන්වීම**

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

**යම් නැවක් පැමිණීමට යටත් පිරිසෙයින් පැය 24 කට පෙර හෝ, යාත්‍රා කාලය පැය 24 කට වඩා අඩු නම්, පූර්ව වරායෙන් නැව පිටත්වන අවස්ථාවේ දී, එම නැවෙහි නෞකාධිපතිවරයා විසින්, පහත දැක්වෙන තොරතුරු සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අදාළ තෙල් පිළිබඳ වාර්තා පොත, නැව්බඩු පිළිබඳ වාර්තා පොත හෝ කසළ පිළිබඳ වාර්තා පොත සමඟ මෙම ආකෘතිපත්‍රය යාත්‍රාවෙහි තබාගත යුතු ය.**

| වරායේ හෝ පර්යන්තයේ නම | වෙත අපද්‍රව්‍ය භාරදුන් බවට වන දැන්වීම |
|---|---|

**භාරදීමේ ආකෘතිපත්‍රය / පූර්ව දැන්වීමේ ආකෘතිපත්‍රය (ANF)**

**නැව පිළිබඳ විස්තර**

1.1 නැවේ නම ______

1.2 IMO අංකය ______

1.3 දළ ටොන් ප්‍රමාණය ______

1.4 නැවේ වර්ගය

- ☐ තෙල් නැව
- ☐ රසායනික දියර ප්‍රවාහන නැව
- ☐ ඇසුරුම් රහිත භාණ්ඩ ප්‍රවාහන නෞකාව
- ☐ බහාලුම
- ☐ වෙනත් භාණ්ඩ ප්‍රවාහන නැව
- ☐ මගී ප්‍රවාහන නැව
- ☐ රෝ-රෝ
- ☐ වෙනත් (නිශ්චිතව දක්වන්න)

**පහසුකම වෙත පිටකිරීමට ඇති අපද්‍රව්‍යවල වර්ගය සහ ප්‍රමාණය**

| මාපෝල් ඇමුණුම I - තෙල් | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| නැව් පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය | - |
| ටැංකි පිරිසිදු කිරීමෙන් පිටවන යකඩ මළකඩ සහ තෙල් බොර | - |
| අපවිත්‍ර බැලස්ට් ජලය | |
| තෙල් ටැංකි සේදීම් | |
| තෙල් අවශේෂ (තෙල් බොර) | |
| වෙනත් | |

| මාපෝල් ඇමුණුම II - NLS | ප්‍රමාණය ($m^3$) / නම[1] |
|---|---|
| OS වෙනත් ද්‍රව්‍ය | / |
| Z කාණ්ඩයේ ද්‍රව්‍ය | / |
| Y කාණ්ඩයේ ද්‍රව්‍ය | / |
| X කාණ්ඩයේ ද්‍රව්‍ය | / |

1 අදාළ NLSහි නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න

2 නිර්ජල නැව්බඩුවල නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න.

1.5 අයිතිකරුගේ හෝ ක්‍රියාකරවන්නාගේ නම

1.6 විශේෂිත අංකය හෝ අක්ෂරය

1.7 ධජය දරන රාජ්‍යය

**වරාය හා මුහුදු ගමන පිළිබඳ විස්තර**

2.1 ස්ථානයේ/ පර්යන්තයේ නම සහ නැවතුම් වරාය

2.2 පැමිණීමේ දිනය සහ වේලාව

2.3 පිටත්වීමේ දිනය සහ වේලාව

2.4 අවසාන වරාය සහ රට

2.5 ඊළඟ වරාය සහ රට (දැන සිටී නම්)

2.6 අපද්‍රව්‍ය භාරදෙන ලද අවසාන වරාය

2.7 අවසාන වරට භාරදෙන ලද දිනය

2.8 ඊළඟ භාරදීමේ වරාය (දැන සිටිනම්)

2.9 මෙම ආකෘතිපත්‍රය භාරදෙන තැනැත්තාගේ නම (නෞකාධිපතිවරයා හැර වෙනත් අයකු නම්)

| මාපෝල් ඇමුණුම IV - මළ අපද්‍රව්‍ය | ප්‍රමාණය ($m^3$) |
|---|---|

| මාපෝල් ඇමුණුම V - කසළ | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| අ. ප්ලාස්ටික් | |
| ආ. ආහාර අපද්‍රව්‍ය | |
| ඇ. ගෘහස්ථ අපද්‍රව්‍ය (උදා. කඩදාසි නිෂ්පාදන, කඩමාලු, වීදුරු, ලෝහ, බෝතල්, පිඟන් භාණ්ඩ ආදිය) | |
| ඈ. කෑම පිසින තෙල් | |
| ඉ. පුලුස්සනු ලැබූ අළු | |
| ඊ. මෙහෙයුම් අපද්‍රව්‍ය | |
| උ. සත්ව මළකුණු (මළකුණු) | |
| ඌ. ධීවර ආම්පන්න | |
| එ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය | |
| ඒ. නැව්බඩු අවශේෂ (HME නොවන) | |
| ඔ. නැව්බඩු අවශේෂ (HME) | |

| මාපෝල් ඇමුණුම VI - වායු දූෂණය | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| ඕසෝන් ක්ෂය කරවන ද්‍රව්‍ය සහ එවැනි ද්‍රව්‍ය අඩංගු උපකරණ | |
| පිටවන දුමාර වායු පිරිසිදු කිරීමේ අවශේෂ | |

නෞකාවේ නම

IMO අංකය

නැව මත ඉතිරිවී ඇති අපද්‍රව්‍ය සහ අවශේෂ ද්‍රව්‍යවල ආසන්න ප්‍රමාණය හා උපරිම ගබඩා ධාරිතා ප්‍රතිශතය කරුණාකර පහතින් සඳහන් කරන්න. මෙම වරායේ දී නැව මත ඇති සියලු අපද්‍රව්‍ය ඔබ විසින් භාරදෙනු ලබන්නේ නම්, කරුණාකර මෙම වගුව කපාහැර පහත කොටුව තුළ හරි (√ ) සලකුණ යොදන්න. ඔබ විසින් අපද්‍රව්‍යවලින් කොටසක් භාරදෙනු ලබන්නේ නම් හෝ අපද්‍රව්‍ය කිසිවක් භාරදෙනු නොලබන්නේ නම්, කරුණාකර සියලු තීර සම්පූර්ණ කරන්න.

මෙම වරායේදී මා විසින් (1 වන පිටුවේ සඳහන් පරිදි) මෙම යාත්‍රාවේ ඇති සියලු අපද්‍රව්‍ය භාරදෙනු ලබන බවට මම තහවුරු කර සිටිමි.

**මාපෝල් ඇමුණුම I - තෙල්**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවා ගත් අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ | ඉතිරි අපද්‍රව්‍ය භාරදෙනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම්දීම සහ ඊළඟ නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තුගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| නැව් පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය | | | | |
| ටැංකි පිරිසිදු කිරීමෙන් පිටවන යකඩ මළකඩ සහ තෙල් බොර | | | | |
| අපවිත්‍ර බැලස්ට් ජලය | | | | |
| තෙල් ටැංකි සේදීම් | | | | |
| තෙල් අවශේෂ (තෙල් බොර) | | | | |
| වෙනත් | | | | |

**මාපෝල් ඇමුණුම II - NLS[2]**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවා ගත් අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ | ඉතිරි අපද්‍රව්‍ය භාරදෙනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම්දීම සහ ඊළඟ නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තුගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| X කාණ්ඩයේ ද්‍රව්‍ය | | | | |
| Y කාණ්ඩයේ ද්‍රව්‍ය | | | | |
| Z කාණ්ඩයේ ද්‍රව්‍ය | | | | |
| OS වෙනත් ද්‍රව්‍ය | | | | |

[2] අදාළ NLS හි නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න

**මාපෝල් ඇමුණුම IV - මළ අපද්‍රව්‍ය**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවා ගත් අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ | ඉතිරි අපද්‍රව්‍ය භාරදෙනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම්දීම සහ ඊළඟ නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තුගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| මළ අපද්‍රව්‍ය | | | | |

**මාපෝල් ඇමුණුම V - කසළ**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවා ගත් අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ | ඉතිරි අපද්‍රව්‍ය භාරදෙනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම්දීම සහ ඊළඟ නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තුගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| අ. ප්ලාස්ටික් | | | | |
| ආ. ආහාර අපද්‍රව්‍ය | | | | |
| ඇ. ගෘහස්ථ අපද්‍රව්‍ය (උදා. කඩදාසි නිෂ්පාදන, කඩමාලු, වීදුරු, ලෝහ, බෝතල්, පිහන් භාණ්ඩ ආදිය) | | | | |
| ඈ. කෑම පිසින තෙල් | | | | |
| ඉ. පුලුස්සනු ලැබූ අළු | | | | |
| ඊ. මෙහෙයුම් අපද්‍රව්‍ය | | | | |
| උ. සත්ව මළකුණ (මළකුණු) | | | | |
| ඌ. ධීවර ආම්පන්න | | | | |
| එ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය | | | | |
| ඒ. නැව්බඩු අවශේෂ (HME නොවන) | | | | |
| ඔ. නැව්බඩු අවශේෂ (HME) | | | | |

**මාපෝල් ඇමුණුම VI - වායු දූෂණය**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවා ගත් අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ | ඉතිරි අපද්‍රව්‍ය භාරදෙනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම්දීම සහ ඊළඟ නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තුගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| ඕසොන් ක්ෂය කරවන ද්‍රව්‍ය සහ එවැනි ද්‍රව්‍ය අඩංගු උපකරණ | | | | |
| පිටවන දුමාර වායු පිරිසිදු කිරීමේ අවශේෂ | | | | |

| නම සහ තනතුර | අත්සන | දිනය | වේලාව |
|---|---|---|---|
| | | | |

{6 වන නියෝගය}

<u>II වන උපලේඛනය</u> - සේවා සපයන්නකු ලෙස ලියාපදිංචිවීම සඳහා වන ඉල්ලුම්පත්‍රය - 20...........

| ඉල්ලුම්පත්‍ර අංක : | |
|---|---|

**නැවෙහි ඇති අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව සඳහා ලියාපදිංචිවීම සඳහා වන ඉල්ලුම්පත්‍රය**

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

| | |
|---|---|
| 1. ලියාපදිංචි ව්‍යාපාර නාමය : | |
| 2. ලියාපදිංචි අංකය : | |
| 3. සමාගමේ ලිපිනය : | |
| 4. විද්‍යුත් තැපැල් (කාර්යාලීය විද්‍යුත් තැපැල්) ලිපිනය : | |
| 5. සම්බන්ධ කරගත හැකි දුරකතන අංක : | 6. ෆැක්ස් අංකය : |
| **MEPA සමඟ ගනුදෙනු කිරීම සඳහා බලය දෙන ලද තැනැත්තන්** | සම්බන්ධ කර ගැනීමේ විස්තර - දුරකතන අංක සහ විද්‍යුත් තැපැල් ලිපින |
| | |
| | |
| | |

| | | | |
|---|---|---|---|
| 7. ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කරන අපද්‍රව්‍ය වර්ග (කරුණාකර අදාළ කොටුව තුළ (√) ලකුණ යොදන්න | අපද්‍රව්‍ය තෙල් | කසළ | මළ අපද්‍රව්‍ය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8. ලියාපදිංචි වන වරායන් | සියලු වරායන් | කොළඹ | ගාල්ල | හම්බන්තොට | ත්‍රිකුණාමලය |

**9. අපද්‍රව්‍ය ගබඩා කිරීමේ/බැහැර කිරීමේ පරිශ්‍රය පිළිබඳ විස්තර (වෙනම පරිශ්‍රයන් භාවිත කරන්නේ නම් වෙන වෙනම සඳහන් කරන්න)**

**9.1 අපද්‍රව්‍ය තෙල් සඳහා**

| | |
|---|---|
| අ. බැහැර කිරීමේ පරිශ්‍රයේ ලිපිනය | |
| ආ. උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රයේ (SWML) විස්තර | SWML අංකය :<br>නිකුත් කළ දිනය :<br>කල් ඉකුත් වන දිනය : |
| ඇ. පරිසර ආරක්ෂණ බලපත්‍රයේ (EPL) විස්තර | EPL අංකය : |

| | |
|---|---|
| | නිකුත් කළ දිනය :<br>කල් ඉකුත් වන දිනය : |

| ඇ. ගබඩා ටැංකිවල විස්තර | | ටැංකි අංකය | ධාරිතාව ($m^3$) | | ටැංකි අංකය | ධාරිතාව ($m^3$) |
|---|---|---|---|---|---|---|
| | 1. | | | 11. | | |
| | 2. | | | 12. | | |
| | 3. | | | 13. | | |
| මුළු ටැංකි සංඛ්‍යාව | 4. | | | 14. | | |
| | 5. | | | 15. | | |
| | 6. | | | 16. | | |
| | 7. | | | 17. | | |
| | 8. | | | 18. | | |
| | 9. | | | 19. | | |
| | 10. | | | 20. | | |
| මුළු ධාරිතාව - ................. $m^3$ | | එකතුව | | | එකතුව | |

| | |
|---|---|
| **9.2 කසළ සඳහා** | |
| අ. අපද්‍රව්‍ය වෙන් කිරීමේ අංගනයේ නම සහ ලිපිනය | |
| ආ. අපද්‍රව්‍ය බැහැර කිරීමේ පරිශ්‍රයේ නම සහ ලිපිනය | |
| ඇ. උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රයේ (SWML) විස්තර | SWML අංකය :<br>නිකුත් කළ දිනය :<br>කල් ඉකුත් වන දිනය : |
| ඈ. පරිසර ආරක්ෂණ බලපත්‍රයේ (EPL) විස්තර | EPL අංකය :<br>නිකුත් කළ දිනය :<br>කල් ඉකුත් වන දිනය : |
| ඉ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගනයේ නම සහ ලිපිනය | |
| ඊ. පරිසර ආරක්ෂණ බලපත්‍රයේ (EPL) විස්තර | EPL අංකය :<br>නිකුත් කළ දිනය :<br>කල් ඉකුත් වන දිනය : |
| **9.3 මළ අපද්‍රව්‍ය සඳහා** | |
| අ. බැහැර කිරීමේ පරිශ්‍රයේ නම සහ ලිපිනය | |
| ආ. පරිසර ආරක්ෂණ බලපත්‍රයේ (EPL) විස්තර | බලපත්‍ර අංකය :<br>නිකුත් කළ දිනය :<br>කල් ඉකුත් වන දිනය : |
| | |

| | | | |
|---|---|---|---|
| 10. ඉල්ලුම්කරු සතුව පවතින තෙල් ඉවත් කිරීමේ උපකරණ පිළිබඳ විස්තර | | | |
| 10.1 තෙල් ඉවත් කිරීමේ නළයේ සහතිකයේ සහ ලේබලයේ අංකය | දිග (මීටර්) | වලංගු කාලසීමාව (පරීක්ෂා කළ) | |
| 10.2 තෙල් පිටාර ගැලීම වැළැක්වීමේ ද්‍රව්‍ය | | | |
| අයිතමය | නම සහ වර්ගය | ප්‍රමාණය | කල් ඉකුත් වන දිනය |
| තෙල් පිටාර ගැලීම විසිරවීමේ ද්‍රව්‍ය | | | |
| අවශෝෂක ද්‍රව්‍ය | | | |
| අවශෝෂක බූම | | | |
| වෙනත් (නිශ්චිතව දක්වන්න) | | | |

| | | |
|---|---|---|
| 10.3 ලබාගත හැකි වෙනත් පිටාර ගැලීම වැළැක්වීමේ උපකරණ | වර්ගය | ප්‍රමාණය |
| **11. ඉල්ලුම්කරු සතුව පවතින ආරක්ෂිත උපකරණ පිළිබඳ විස්තර** | | |
| 11.1 පෞද්ගලික ආරක්ෂිත උපකරණ | වර්ගය | ප්‍රමාණය |
| 1. මුළු සිරුරම ආවරණය වන ඇඳුම (ආරක්ෂිත ඇඳුම්) | | |
| 2. ආරක්ෂක හිස්වැසුම් | | |
| 3. ආරක්ෂක සපත්තු | | |
| 4. අත් ආවරණ (තෙල් ප්‍රතිරෝධී) | | |
| 5. ආරක්ෂක පටි | | |
| 6. ආරක්ෂක කණ්ණාඩි | | |
| 7. ජීවිත ආරක්ෂක කබා | | |
| 8. වෙනත් (කරුණාකර නිශ්චිතව දක්වන්න) | | |
| | | |
| 12. තෙල් ඉවත් කිරීමේ මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනු ලබන තැනැත්තන් පිළිබඳ විස්තර ( * ලේඛනමය සාක්ෂි මගින් තහවුරු කළ යුතු ය) | | |

| නම | සුදුසුකම් (ඇත්නම්) * | පළපුරුද්ද (ඇත්නම්) * |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| **13.1** අපද්‍රව්‍ය පැටවීම සහ ප්‍රවාහනය කිරීම | | | |
|---|---|---|---|
| වාහනවල ලියාපදිංචි අංක | වර්ගය (ලොරි/ප්‍රවාහන රථ/ ගලි බවුසර) | ධාරිතාව ($m^3$) | ආරක්ෂිත බව පිළිබඳ පරීක්ෂාවේ ලේබල අංකය සහ කල් ඉකුත්වන දිනය |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| 13.2 නැවේ/බත්තලේ නම | | 1. | 2. |
|---|---|---|---|
| IMO අංකය | | | |
| GRT | | | |
| වෙළඳ නැව් ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ ලියාපදිංචි සහතිකය | නිකුත් කළ දිනය | | |
| | කල් ඉකුත් වන දිනය | | |
| දූෂණය පිළිබඳ වගකීම සඳහා වන රක්ෂණ සහතිකය | නිකුත් කළ දිනය | | |
| | කල් ඉකුත් වන දිනය | | |
| රැගෙන යාමේ ධාරිතාව ($m^3$) | | | |

| **14.** පසුගිය අවුරුදු 3 තුළ සිදු කරන ලද අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මෙහෙයුම් පිළිබඳ විස්තර (කරුණාකර නිවැරදි විස්තර සපයන්න) | | | |
|---|---|---|---|
| වර්ෂය | | | |
| සිදු කරන ලද වැඩකටයුතු සංඛ්‍යාව | | | |
| | | | |

| **15.** අමුණා ඇති සහතිකවල පිටපත් (ඉදිරියෙන් ඇති කොටුවේ හරි (“ √ ”) ලකුණ යොදන්න) | |
|---|---|
| අ. සමාගමේ ලියාපදිංචි සහතිකය | ☐ |
| ආ. වරායක් ඇතුළත මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා වන (අදාළ කාණ්ඩය සඳහා) SLPA බලපත්‍රය | ☐ |
| ඇ. අපද්‍රව්‍ය බැහැර කිරීම/ ගබඩා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද උපලේඛනගත අපද්‍රව්‍ය කළමණාකරණ බලපත්‍රය (SWML) | ☐ |
| ඈ. සුන්බුන් බලපත්‍රය | ☐ |
| ඉ. කසළ බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද නියෝජ්‍යාතනයෙන් ලබා දී ඇති අවසරපත්‍රය | ☐ |
| ඊ. මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද නියෝජ්‍යායතනය විසින් ලබා දී ඇති අවසරපත්‍රය | ☐ |
| උ. නැව්/බත්තල් සඳහා වන නැව් ලියාපදිංචිය සහ දූෂණය පිළිබඳ වගකීම් රක්ෂණය | ☐ |
| ඌ. නළ පරීක්ෂණ සහතිකය | ☐ |
| එ. බවුසර සඳහා වන ආරක්ෂිත බව පිළිබඳ පරීක්ෂණ සහතිකය | ☐ |
| ඒ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් වන සහතිකය | ☐ |

**කරුණාකාර ...................... නමැති සමාගම (සමාගමේ නම) ........................ වර්ෂය සඳහා සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචි කරන මෙන් ඉල්ලා සිටිමි. මා විසින් නැවෙහි ඇති අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය කිරීම පිළිබඳ නියෝගවල අන්තර්ගත කරුණු මැනවින් අධ්‍යයනය කරන ලද අතර, සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව යටතේ එහි සඳහන් නියම මගින් බැඳී සිටීමට මා එකඟ වන බව සහතික කර සිටිමි.**

....................................... .......................................

නම අත්සන

දිනය : දිනය/මාසය/වර්ෂය

ඉල්ලුම්කරුගේ මුද්‍රාව

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි | | | |
|---|---|---|---|
| | | | |
| ඉල්ලුම්පත්‍රය ලැබුණු දිනය | | පරීක්ෂණය අවසන් කළ දිනය | |
| තැන්පතුවේ ලදුපත් අංකය | | මුදල (රු.) | දිනය |
| | | | |
| නිර්දේශ කළ තැනැත්තාගේ අත්සන | | අනුමත කළ තැනැත්තාගේ අත්සන | |
| | | | |

{6(1අ) වන, 7(2) වන සහ 8(1) වන නියෝග}

## <u>III වන උපලේඛනය.</u>

### නියෝග යටතේ අයකරනු ලබන ගාස්තු පිළිබඳ විස්තර

| **1. වාර්ෂිකව සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම** | |
|---|---|
| අ. ශ්‍රී ලංකාව තුළ පිහිටි වරායකට, නැව් තොටකට, පර්යන්තයකට, නැව් අලුත්වැඩියා පොළකට, නිර්ජල නැව් තටාකාංගනයකට, නැංගුරම් ස්ථානයකට හෝ අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමකට හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමකට පැමිණ ඇති නැවක් සඳහා | |
| **ක්‍රියාකාරකම** | **ගාස්තුව (රු.)** |
| ඉල්ලුම්පත්‍ර ගාස්තුව | රු. 2,000.00 |
| **කොළඹ වරාය සඳහා ලියාපදිංචි ගාස්තුව** | |
| මළ අපද්‍රව්‍ය සඳහා පමණක් | 50,000.00 |
| කසළ සඳහා පමණක් | 50,000.00 |

| | |
|---|---|
| අපද්‍රව්‍ය තෙල් සඳහා පමණක් | 150,000.00 |
| තෙල් අපද්‍රව්‍ය, කසළ හෝ මළ අපද්‍රව්‍ය සඳහා පමණක් | 230,000.00 |
| **ගාල්ල, ත්‍රිකුණාමලය හෝ හම්බන්තොට වරායන් සඳහා ලියාපදිංචි ගාස්තුව** | |
| මළ අපද්‍රව්‍ය සඳහා පමණක් | 30,000.00 |
| කසළ සඳහා පමණක් | 30,000.00 |
| අපද්‍රව්‍ය තෙල් සඳහා පමණක් | 100,000.00 |
| තෙල් අපද්‍රව්‍ය, කසළ හෝ මළ අපද්‍රව්‍ය සඳහා පමණක් | 150,000.00 |
| **සියලු වරායන් සඳහා ලියාපදිංචි ගාස්තුව** | |
| සියලු වරායන්, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, නැංගුරම් ස්ථාන, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම් හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම් සඳහා ලියාපදිංචි ගාස්තුව | 500,000.00 |
| ආ. ශ්‍රී ලංකාවේ ජල තීරය හරහා යන නැව් හෝ ශ්‍රී ලංකාවේ වරායවලට නොපැමිණෙන නැව් සඳහා | |
| ලියාපදිංචි ගාස්තුව | 1,500,000.00 |
| **2. අවසරපත්‍ර ගාස්තුව සහ අපද්‍රව්‍ය තෙල් ඉවත් කිරීමේ ගාස්තුව** | |
| අ. නැව් සඳහා වන තනි පුද්ගල අවසරපත්‍ර ගාස්තුව<br>(අවසර පත්‍රයක වලංගු කාලසීමාව නිකුත් කළ දින සිට දින 15ක් වේ.) | 10,000.00 |
| ආ. ජලයද ඇතුළුව තෙල් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගාස්තුව | $1m^3$ සඳහා රු. 2,000.00 |

{7(3) වන නියෝගය}

IV වන උපලේඛනය

**ලියාපදිංචි කිරීමේ සහතිකය**

**ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)**

(2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලදී)

**අංක. 02/2011 දරන නියෝගය**

---

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 21 වන සහ 51 වන වගන්ති ප්‍රකාරව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යටතේ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම සඳහා ඒ/බී/සී/ඩී/ කාණ්ඩයේ සේවා සපයන්නකු වශයෙන් ........................ හි පදිංචි (ලිපිනය) ....................... යන අය (නම) .......................... (දිනය) සිට බලපැවැත්වෙන පරිදි ලියාපදිංචි කරනු ලබන බව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) විසින් සතුටින් දන්වා සිටිනු ලැබේ.

..........................වරායේදී ( වරාය/ වරායන්) අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇති ................................. යන අයට (නම) නැව්වලින් පහත දැක්වෙන කාණ්ඩවල අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය කිරීම සඳහා අවසර දෙනු ලැබේ:-

(අ). තෙල් අපද්‍රව්‍ය - අපවිත්‍ර බැලස්ට් ජලය, නැව්වල පතුළේ රඳෙන තෙල් මිශ්‍රිත ජලය, අපවිත්‍ර ජලය සහ තෙල් බොර, ටැංකි සේදීම්, තෙල්, තෙල් සහිත කඩමාලු, තෙල් මිශ්‍රිත යන්ත්‍රෝපකරණ නඩත්තු අවශේෂ කොටස්.

(ආ). කසළ - ප්ලාස්ටික්, ෆෝම් වර්ග සහ වෙනත් ඇසුරුම් ද්‍රව්‍ය, නැවෙහි ඇති සියලු වර්ගවල (අන්තරායදායක නොවන) ගෘහස්ථ කසළ, නැව්බඩු අවශේෂ.

(ඇ). මළ අපද්‍රව්‍ය - ඕනෑම ආකාරයක වැසිකිළි හා කැසිකිළි වෙතින් පිටවන මළාපවහන හා වෙනත් අපද්‍රව්‍ය හෝ සජීවී සතුන් සිටින ස්ථානවලින් පිටවන අපද්‍රව්‍ය හෝ වෛද්‍ය පරිශ්‍රවලින් පිටවන අපද්‍රව්‍ය හෝ මෙහි විස්තර කර ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍රවී ඇති වෙනත් අපජලය.

කලින් අත්හිටුවනු ලැබුවහොත් හෝ අවලංගු කරනු ලැබුවහොත් මිස, මෙම ලියාපදිංචිය ......................... (දින) සිට .......................... (දින) දක්වා වලංගු වේ.

| අපද්‍රව්‍ය තෙල් කාණ්ඩය | |
|---|---|
| • එක් අවසරපත්‍රයක් සඳහා වන අපද්‍රව්‍ය තෙල් ඉවත් කිරීමේ සීමාව | ............. $m^3$ |
| • ගබඩා ධාරිතාව | ............. $m^3$ |
| • අපද්‍රව්‍ය තෙල් පවිත්‍රකරණ ධාරිතාව | ............. $m^3$ |
| • ප්‍රතිග්‍රහණ යාත්‍රාවේ/ බත්තලේ ධාරිතාව | ............. $m^3$ |
| • මාර්ග ප්‍රවාහන ධාරිතාව | ............. $m^3$ |

**නිකුත් කළ දිනය: (දිනය)**

**සාමාන්‍යාධිකාරී,**
**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.**

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක. 177, නාවල පාර, කොළඹ 05**
**දුරකථන : (+9411)2554373, ෆැක්ස් : (+9411)2556505/255417345,**
**ඊමේල් : info@mepa.gov.lk**

{8(1) වන නියෝගය}

V වන උපලේඛනය - අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසරපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

වරායේ ප්‍රතිග්‍රහණ පහසුකම් වෙත අපද්‍රව්‍ය භාරදීම - අපද්‍රව්‍ය බැහැර කිරීමේ ඉල්ලීම (නැව/නැව් අනුයෝජිතයා)

අපද්‍රව්‍ය බැහැර කිරීමේ ඉල්ලීම

ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

.................................... (වරායේ හෝ පර්යන්තයේ නම) වෙත අපද්‍රව්‍ය භාරදීමේ දැන්වීම)

කොළඹ ☐ ගාල්ල ☐ හම්බන්තොට ☐ ත්‍රිකුණාමලය ☐

**1** වන කොටස

**1.0** නැව පිළිබඳ විස්තර

| | | |
|---|---|---|
| 1.1 | නැවේ නම | |
| 1.2 | IMO අංකය | |
| 1.3 | දළ ටොන් ප්‍රමාණය | |

**1.4** නැවේ වර්ගය

- ☐ තෙල් නැව
- ☐ රසායනික දියර ප්‍රවාහන නැව
- ☐ ඇසුරුම් රහිත භාණ්ඩ ප්‍රවාහන
- ☐ නෞකාව
- ☐ බහාලුම
- ☐ වෙනත් භාණ්ඩ ප්‍රවාහන නැව
- ☐ මගී ප්‍රවාහන නැව
- ☐ රෝ - රෝ
- ☐ වෙනත් (නිශ්චිතව දක්වන්න)

**2** වන කොටස

පහසුකම වෙත පිට කිරීමට ඇති අපද්‍රව්‍ය වර්ගය සහ ප්‍රමාණය

| මාපෝල් ඇමුණුම I - තෙල් | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| නැව්වල පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය | |
| තෙල් අවශේෂ (තෙල් බොර) | |
| තෙල් ටැංකි සේදීම් | |
| අපවිත්‍ර බැලස්ට් ජලය | |
| ටැංකි පිරිසිදු කිරීමෙන් පිටවන යකඩ මළ සහ තෙල් බොර | |
| වෙනත් (නිශ්චිත දක්වන්න) | |
| **මාපෝල් ඇමුණුම II - NLS** | **ප්‍රමාණය ($m^3$) නම[1]** |
| X කාණ්ඩයේ ද්‍රව්‍ය | |
| Y කාණ්ඩයේ ද්‍රව්‍ය | |
| Z කාණ්ඩයේ ද්‍රව්‍ය | |
| OS - වෙනත් ද්‍රව්‍ය | |

| | |
|---|---|
| 1.5 අයිතිකරුගේ හෝ ක්‍රියාකරවන්නාගේ නම | |
| 1.6 ධජය දරන රාජ්‍ය | |

**2.0** වරාය සහ මුහුදු ගමන පිළිබඳ විස්තර

| | |
|---|---|
| 2.1 අවසාන වරාය සහ රට | |
| 2.2 අපද්‍රව්‍ය භාරදෙන ලද අවසාන වරාය | |
| 2.3 අවසාන වරට භාරදෙන ලද දිනය | |
| 2.4 විද්‍යුත් තැපැල් ලිපිනය | |
| 2.5 සම්බන්ධ කරගැනීමේ දුරකතන අංකය | |
| 2.6 පර්යන්තය | |

**3.** වන කොටස
ඉල්ලුම්කරුගේ විස්තර

| | |
|---|---|
| නම | |
| තනතුර | |
| දේශීය නැව් අනුයෝජිතයා | |

| | |
|---|---|
| **මාපෝල් ඇමුණුම IV - මළ අපද්‍රව්‍ය** | **ප්‍රමාණය ($m^3$)** |
| | |
| **මාපෝල් ඇමුණුම V - කසළ** | **ප්‍රමාණය ($m^3$)** |
| අ. ප්ලාස්ටික් | |
| ආ. ආහාර අපද්‍රව්‍ය | |
| ඇ. ගෘහස්ථ අපද්‍රව්‍ය (උදා: කඩදාසි නිෂ්පාදන, කඩමාලු, වීදුරු, ලෝහ, බෝතල්, පිඟන් භාණ්ඩ ආදිය) | |
| ඇ. කෑම පිසින තෙල් | |
| ඉ. පුලුස්සනු ලැබූ අළු | |
| ඊ. මෙහෙයුම් අපද්‍රව්‍ය | |
| උ. සත්ව මළකුණ (මළකුණු) | |
| ඌ. ධීවර ආම්පන්න | |
| එ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය | |
| ඒ. නැව්බඩු අවශේෂ (HME නොවන) | |
| ඔ. නැව්බඩු අවශේෂ (HME) | |
| **මාපෝල් ඇමුණුම VI - වායු දූෂණය** | **ප්‍රමාණය ($m^3$)** |
| **ඕසෝන් ක්ෂය කරවන ද්‍රව්‍ය සහ එවැනි ද්‍රව්‍ය අඩංගු උපකරණ** | |
| **පිටවන දුමාර වායු පිරිසිදු කිරීමේ** අවශේෂ | |

| | |
|---|---|
| දිනය | |

{8(1) වන නියෝගය}

**VI වන උපලේඛනය - අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසරපත්‍රය**

**ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)**

**නැවෙහි ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීමේ අවසරපත්‍රය *** **අනුක්‍රමික අංකය ...........................**

| | |
|---|---|
| ලියාපදිංචි අංකය | |
| IRP අංකය | |
| ලදුපත් අංකය | |

**1** වන කොටස ඉල්ලුම්පත්‍රය පිළිබඳ විස්තර සහ ප්‍රකාශය

1.1 ලියාපදිංචි සේවා සපයන්නාගේ නම .....................................................

1.2 යාත්‍රාව : (අ) නම ............................. (ආ) වර්ගය ........................ (ඇ) ධජය ..................
(ඈ) නැංගුරම් ස්ථානය ............... (ඉ) පැමිණීමේ දිනය ............ (ඊ) පිටත්වීමේ දිනය ...........................

1.3 අවසාන වරාය .............................. 1.4 ඊළඟ වරාය ................................

1.5 යාත්‍රාවේ දේශීය අනුයෝජිතයාගේ නම: ......................................................

1.6 ඉවත් කිරීමට ඇති අපද්‍රව්‍ය වර්ගය සහ ප්‍රමාණය :- කසළ ........................ තෙල් අපද්‍රව්‍ය ...........................

1.7 ඉවත් කරන ක්‍රමය (නිශ්චිතව දක්වන්න :- පීප්ප/ ප්‍රවාහන රථ/ බත්තල/ වෙනත්) ............................

1.8 ප්‍රවාහන රථයේ/ ට්‍රක් රථයේ/ වෙනත් රථයේ ලියාපදිංචි අංකය :- ................................

1.9 බැහැර කිරීම පිළිබඳ විස්තර :-

| *අපද්‍රව්‍ය වර්ගය* | *ප්‍රමාණය* | *බැහැර කිරීමේ පරිශ්‍රයේ නම සහ ලිපිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

මෙම අවසරපත්‍රය සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නියෝග මගින් බැඳී සිටීමටත්, යථා පරිදි සම්පූර්ණ කරන ලද MEPA/..................... (අනුක්‍රමික අංකය) දරන (මෙම ලේඛනයේ) 1 වන පිටපත අදාළ කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසු සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ආපසු භාරදීමටත් එකඟ වෙමි.

......................................... ................................ ........................
සේවා සපයන්නාගේ මුද්‍රාව අත්සන දිනය

2 වන කොටස MEPA විසින් සම්පූර්ණ කළ යුතුය

**MEPA විසින් බලය පැවරීම**

............................................. යන අය 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ MEPA හි ලියාපදිංචි සේවා සපයන්නකු බවට මා විසින් සහතික කරනු ලබන අතර, ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙනුවෙන් MEPA / .................. (අනුක්‍රමික අංකය) දරන පෞද්ගලික ප්‍රතිග්‍රහණ අවසරපත්‍රය යටතේ ඉහත 1.6 හි සඳහන් යාත්‍රාවේ ඇති නැව් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා එම සේවා සපයන්නා වෙත මෙයින් බලය පවරමි.

| ......................................... | ................................ | .............................. |
|---|---|---|
| MEPA මුද්‍රාව | අත්සන | දිනය |

**3 වන කොටස** SLPA විසින් සම්පූර්ණ කළ යුතු ය

**නැවේ ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා 1.2 අයිතමයේ සඳහන් යාත්‍රාව මතට යාමට SLPA විසින් දෙනු ලබන අවසරය**

| ......................................... | ................................ | .............................. |
|---|---|---|
| නාවික අංශයේ මුද්‍රාව | අවසරය ලබාදෙන නිලධරයාගේ අත්සන | දිනය |

**4 අ කොටස** නැව් කපිතාන් විසින් සම්පූර්ණ කළ යුතුය.

4.1 ඉවත් කිරීමේ මෙහෙයුමේ කාලසීමාව ( දින සහ වේලාවන්) .......................

4.2 සම්පූර්ණ අපද්‍රව්‍ය ප්‍රමාණය - යොමුව. අවසරපත්‍ර අංකය ................

4.3 තෙල් පිළිබඳ වාර්තා පොතේ/ කසළ පිළිබඳ වාර්තා පොතේ සටහන් තබා තිබේද යන්න (ඔව්/ නැත)

4.3.1 පිළිතුර ඔව් නම්, වාර්තා යොමුව ..................

4.3.2 පිළිතුර නැත නම්, (සටහන) ..................

MEPA - WRS
අවසරපත්‍ර අංකය

දිනය නැවේ නිල මුද්‍රාව සහ අත්සන

**4 ආ කොටස සේවා සපයන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.**

සේවා සපයන්නාගේ මුද්‍රාව සහ අත්සන දිනය

**5 වන කොටස**

ශ්‍රී ලංකා රේගුව විසින් සම්පූර්ණ කළ යුතු ය
ඉහත 4අ කොටසේ සඳහන් අපද්‍රව්‍ය ඉවත් කිරීම රේගු අධීක්ෂණවලට යටත්වන ලදී. බදු පනවන ලදී/ නොපනවන ලදී. බදු පනවන ලද්දේ නම්, වාර්තා යොමු අංකය ........................

| ..................................... | ................................. | .................................... |
|---|---|---|
| බලයලත් නිලධරයාගේ අත්සන/ ශ්‍රී ලංකා රේගුව | දිනය | ශ්‍රී ලංකා රේගු මුද්‍රාව |

**6 වන කොටස** අපද්‍රව්‍ය අවසාන වශයෙන් ප්‍රතිග්‍රහණය කරන තැනැත්තා විසින් සම්පූර්ණ කළ යුතු ය

මා විසින් වගුවට අනුව අපද්‍රව්‍ය ලබාගන්නා ලදී.

| අපද්‍රව්‍ය වර්ගය | ප්‍රමාණය (MT) | ප්‍රතිග්‍රහණ දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

| ..................................... | ................................. | .................................... |
|---|---|---|
| බලයලත් ප්‍රතිග්‍රාහකයාගේ අත්සන සහ නිල මුද්‍රාව | දිනය | EPL අංකය/ පළාත් පාලන ආයතන ලිපියේ අංකය: |

1 වන පිටපත - MEPA වෙත භාරදීම සඳහා, 2 වන පිටපත -SLPA වෙත, 3 වන පිටපත - ශ්‍රී ලංකා රේගුව වෙත, 4 වන පිටපත - සේවා සපයන්නා වෙත.

(2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලදී.)

**ශ්‍රී ලංකාවේ කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 177 පිහිටි සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් නිකුත් කරන ලදී.**

දුරකතන අංකය: +94 11 2554373 ෆැක්ස් අංකය: +94 11 2556505

විද්‍යුත් තැපැල් ලිපිනය : info@mepa.gov.lk වෙබ් අඩවිය: www.mepa.gov.lk

{10(1) වන නියෝගය}

<u>VII වන උපලේඛනය</u> - අපද්‍රව්‍ය භාරදීමේ සහතිකය

**නැවක් විසින් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකමක්/ සේවාවක් භාවිත කිරීමෙන් පසු අපද්‍රව්‍ය භාරදීමේ ලදුපත**

ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)

(2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 21 වන වගන්තිය)

**1. ප්‍රතිග්‍රහණ පහසුකම සහ වරාය පිළිබඳ විස්තර**

| | |
|---|---|
| අවසරපත්‍ර අංකය: | |
| ලදුපත් අංකය: | |

| | |
|---|---|
| 1.1 ස්ථානයේ/ පර්යන්තයේ නම: | |
| 1.2 ප්‍රතිග්‍රහණ පහසුකම සපයන්නාගේ (සපයන්නන්ගේ) නම: | |
| 1.3 පිළියම් පහසුකම සපයන්නන්ගේ නම්: | |
| 1.4 අපද්‍රව්‍ය පිට කළ දිනය සහ වේලාව: ............ සිට ........... දක්වා | |

**2. නැව පිළිබඳ විස්තර**

| | |
|---|---|
| 2.1 නැවේ නම: | 2.5 අයිතිකරුගේ හෝ ක්‍රියාකරවන්නාගේ නම: |
| 2.2. IMO අංකය: | 2.6 විශේෂිත අංකය හෝ අක්ෂර: |
| 2.3 දළ ටොන් ප්‍රමාණය | 2.7 ධජය දරන රාජ්‍යය: |
| 2.4<br>නැවේ වර්ගය ☐ තෙල් නැව ☐ රසායනික දියර ප්‍රවාහන නැව ☐ ඇසුරුම් රහිත භාණ්ඩ ප්‍රවාහන නැව ☐ බහාලුම ☐ වෙනත් භාණ්ඩ ප්‍රවාහන නැව ☐ මගී ප්‍රවාහන නැව ☐ රෝ-රෝ ☐ වෙනත් (නිශ්චිතව දක්වන්න) .................................. | |

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 21 වන වගන්තිය යටතේ, MEPA විසින්, පහත 3 වන අයිතමය යටතේ සඳහන් කර ඇති වර්ගවල සහ ප්‍රමාණවල අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ....................................... ට මෙයින් බලය පවරනු ලැබේ.

නම සහ අත්සන ................................ දිනය ........................... MEPA මුද්‍රාව

**3. ප්‍රතිග්‍රහණය කළ අපද්‍රව්‍ය වර්ගය සහ ප්‍රමාණය**

| *මාපෝල් ඇමුණුම I - තෙල්* | *ප්‍රමාණය ($m^3$)* |
|---|---|
| | |
| වෙනත් | |
| ටැංකි පිරිසිදු කිරීමෙන් පිටවන යකඩ මළ සහ තෙල් බොර | |

| *මාපෝල් ඇමුණුම V - කසළ* | *ප්‍රමාණය ($m^3$)* |
|---|---|
| අ. ප්ලාස්ටික් | |
| ආ. ආහාර අපද්‍රව්‍ය | |

| | |
|---|---|
| අපවිත්‍ර බැලස්ට් ජලය | |
| තෙල් ටැංකි සේදීම් | |
| තෙල් අවශේෂ (තෙල් බොර) | |
| නැව්වල පතුළේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය | |

| *මාපෝල් ඇමුණුම IV - මළ අපද්‍රව්‍ය* | *ප්‍රමාණය ($m^3$)* |
|---|---|
| | |

| *මාපෝල් ඇමුණුම VI - වායු දූෂණය* | *ප්‍රමාණය ($m^3$)* |
|---|---|
| පිටවන දුමාර වායු පිරිසිදු කිරීමේ අවශේෂ | |
| ඕසෝන් ක්ෂය කරවන ද්‍රව්‍ය සහ උපකරණ | |

| | |
|---|---|
| ඇ. ගෘහස්ථ අපද්‍රව්‍ය (උදා: කඩදාසි නිෂ්පාදන, කඩමාලු, වීදුරු, ලෝහ, බෝතල්, පිඟන් භාණ්ඩ ආදිය) | |
| ඇ. කෑම පිසින තෙල් | |
| ඉ. පුලුස්සනු ලැබූ අළු | |
| ඊ. මෙහෙයුම් අපද්‍රව්‍ය | |
| උ. සත්ව මළකුණ (මළකුණු) | |
| ඌ. ධීවර ආම්පන්න | |
| එ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය | |
| ඒ. නැව්බඩු අවශේෂ (HME නොවන) | |
| ඔ. නැව්බඩු අවශේෂ (HME ) | |

| *මාපෝල් ඇමුණුම II - NLS* | *ප්‍රමාණය ($m^3$)* |
|---|---|
| | |
| OS - වෙනත් ද්‍රව්‍ය | |
| Z කාණ්ඩයේ ද්‍රව්‍ය | |
| Y කාණ්ඩයේ ද්‍රව්‍ය | |
| X කාණ්ඩයේ ද්‍රව්‍ය | |

**4. යාත්‍රාවේ කපිතාන් විසින් සම්පූර්ණ කළ යුතු ය**

........................... යාත්‍රාව වෙනුවෙන් ඉහත සඳහන් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම/ සේවා සපයන්නන් වෙත භාරදුන් බව මම තහවුරු කර සිටිමි. යාත්‍රාවේ පවත්වාගෙන යන වාර්තාවලට ඒ පිළිබඳ සටහන් ඇතුළත් කරන ලදී.

නම සහ අත්සන ............................... දිනය .......................... නැවේ නිල මුද්‍රාව

**5. සේවා සපයන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය**

මා විසින් MEPA වෙනුවෙන් ................................... යාත්‍රාවෙන් ඉහත සඳහන් අපද්‍රව්‍ය එකතු කර ගනු ලැබූ බව මම තහවුරු කර සිටිමි.

නම සහ අත්සන ............................... දිනය .......................... සමාගමේ නම සහ මුද්‍රාව

**සැලකිය යුතු ය:** එකී ලදුපතෙහි **MEPA** හි නිල මුද්‍රාව සහ **MEPA** නිලධරයාගේ අත්සන දැක්වෙන්නේ නම් මිස, ලදුපත වලංගු නොවේ.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකතන අංකය: +94 11 2554373 ෆැක්ස් අංකය: +94 11 2556505
විද්‍යුත් තැපැල් ලිපිනය: info@mepa.gov.lk වෙබ් අඩවිය: www.mepa.gov.lk

EOG04-0080

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.